# පුරාණ ශ්‍රී ලංකාවේ ශ්‍රී පාදස්ථානය තෙක් විහිදුණු ගමන් මාර්ග පිළිබඳ අධ්‍යයනයක්

එම්. ඒ. ප්‍රසාද් කුමාර[1]

**සංක්ෂේපය**

රජරට රාජධානියෙහි සිට ශ්‍රී පාදස්ථානය දක්වා විහිදී ගිය ගමන් මාර්ග පිළිබඳ ව සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රය ඇසුරින් පුළුල්ව සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ. ප්‍රස්තුතය සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය හඳුනාගැනීම, ඒවා සියුම්ව අධ්‍යයනය කිරීම, පුරාණ මාර්ග පද්ධතිය, එහි ස්වභාවය සහ වර්තමාන තත්ත්වය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු විය. මේ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනිමේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදාගත් අතර මාර්ග පද්ධතිය පිළිබඳ ව ක්ෂේත්‍ර අධ්‍යයන ඔස්සේ තොරතුරු ලබාගැනීම සිදුවිය. රජරට රාජධානියේ සිට සමනොළ ගිර දක්වා විහිදුනු මාර්ග 03ක් පුරාණයේ සිට පැවත තිබේ. රත්නපුරයේ සිට ගිලිමලේ හරහා මාර්ගය, කෙහෙල්ගමුවේ සිට විහිද ගිය මාර්ගය, නැගෙනහිර සිට ඌව හරහා විහිද ගිය මාර්ගය එම මාර්ග 03යි. 1වන විජයබාහු රජු ශ්‍රී පාදයට යන මෙම මාර්ග ප්‍රතිසංස්කරණය කළ බවට එන මහාවංශ පුවත අඹගමුව ශිලා ලිපියෙන් හෙළිදරව් වී ඇත. නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව. 1187-1196) ශ්‍රී පාදය වැඳපුදාගැනීමට ගිය බව අභිලේඛනවල දැක්වේ." සමනොළ යන මඟ ජල දුර්ග, වන දුර්ගයන් අති දුර්ගය පින් ලෝභයෙන් අවුරුදු පතා යන අෂ්ටාදේශවාසි සත්ත්වයෝ බොහෝ පීඩා විඳිනාහ" යනුවෙන් කල්පනා කළ දෙවන පරාක්‍රමබාහු රජු එම මාර්ගය පිළිසකර කිරීමට දේව ප්‍රතිරාජ ඇමතියා යැවූ බව මහාවංශය දක්වයි ක්‍රි.ව. 1340 දී ලංකාවට පැමිණි ඉබන් බතූතා 'බබා පාර' හා 'මමා පාර' යනුවෙන් ශ්‍රී පාදයට නැගිය හැකි මාර්ග දෙකක් දක්වා ඇත. ආදම්ගේ පාර සහ ඒවගේ පාර යන අරුත එහි ඇත. මේ අනුව පුරාණ ලංකාවේ ශ්‍රී පාදය තෙක් විහිදුනු මාර්ග රැසක තොරතුරු හෙළිදරව් වන බව පැහැදිලිය. එහෙත් වර්තමානය වන විට ප්‍රධාන මාර්ග දෙකක් හැර සෙසු මාර්ග උපයෝගිතාවයෙන් දුරස් ව ඇත.

**මුඛ්‍ය පද:** *අභිලේඛන, ඉබන් බතූතා, දුර්ග, බබා පාර, මමා පාර, සමනොළ*

---

[1] සහය කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

prasadmallawaarachchi85@gmail.com